සැ. යු. - 2021.12.31 වැනි දින පළ කරන ලද අංක 2,261 දරන *ගැසට්* පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,262 - 2022 ජනවාරි මස 07 වැනි සිකුරාදා - 2022.01.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 12 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 15 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජනවාරි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


11 - B 82306— 5,403 (2022/01)

# පළාත් පාලන නිවේදන

## මාතලේ මහා නගර සභාව - පරිපූරක ඇස්තමේන්තුව- 2021

අංක 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 214(ආ) වගන්තිය ප්‍රකාර මාතලේ මහා නගර සභාවේ 2021 වර්ෂය සඳහා වන පරිපූරක ඇස්තමේන්තු 2021 දෙසැම්බර් මස 24 වනදායින් ඇරඹී දින 07 ක් ගතවන තුරු මාතලේ මහා නගර සභා කර්යාලයේ මහජන පරීක්ෂණය සඳහා විවෘතව තබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ප්‍රකාශ්,
නගරාධිපති,
මහා නගර සභාව,
මාතලේ.

2021 දෙසැම්බර් මස 23 වැනි දින,
මාතලේ මහා නගර සභා කාර්යාලයේ දී ය.

01-24

---

සංශෝධනයයි

## වත්තල මාබෝල නගර සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම සඳහන් වන පුද්ගයින් විසින් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි 2022.01.01 වැනි දින සිට 2022.12.31 වැනි දින දක්වා ගෝසාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බැවින්. ඒ සම්බන්ධයෙන් වත්තල නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, තමා විරුද්ධත්වය දක්වීමට හේතු විස්තර සහිතව පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින් දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතු බවට ගෝසාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) අංක 7(2) වැනි වගන්තිය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

මාර්ක් ඒ. එෆ්. ගුණසේකර,
සභාපති,
වත්තල මාබෝල නගර සභාව.

වත්තල මාබෝල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාර* | *ව්‍යාපාරය පවත්වන ස්ථානයේ ලිපිනය* |
|---|---|---|---|
| 01 | සේගුදාවුඩ් නජුමුදීන්<br>අංක 752/3, මීගමු පාර, මාබෝල, වත්තල | ගව/එළු | අංක 41/12,<br>දෙල්ගහවත්ත, දූවවත්ත,<br>මාබෝල, වත්තල |

01-69

## අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

### 109 වගන්තිය අනුව 2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 වගන්තිය අනුව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව වෙනත් ගාස්තු නියම කර අයකළ යුතු බවට 2021.11.12 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් පළකළ ආදාහනාගාර වෙන් කිරීම වෙනුවෙන් වන ගාස්තු පහත ආකාරයෙන් සංශෝධනය කිරීමට 2021.11.23 වැනි දින මහ සභාවේදී සභා යෝජනා අංක (ඊ) 13 යටතේ ඒකමතිකව සම්මත වූ බව නිවේදනය කරමි.

*ආදාහනාගාරයේ වෙන් කිරීම :*

බල ප්‍රදේශය තුළ සිදු වන එක් ආදාහනාගාරයක් සඳහා - රු. 5,700 + 300 = 6,000
බල ප්‍රදේශයෙන් පිටත සිදුවන එක් ආදාහනාගාරයක් සඳහා - රු. 6,700 + 300 = 7,000

(කලින් කලට රජය පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාළ වේ.)

ඒ. ඒ. ප්‍රියන්ත පුෂ්පකුමාර,
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
නිට්ටඹුව,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

01-43

---

## මාතර මහා නගර සභාව

### 1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍රදීමේ පනත

මෙකී පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2022 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
පුරපති, "
මහා නගර සභාව,
මාතර.

2021 දෙසැම්බර් මස 27 වැනි දින,
මහා නගර සභාව,
මාතර.
(උපලේඛනය පහත දක්වේ.)

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම් සභාපති/කළමනාකරු* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථාන* |
|---|---|---|---|
| සුනිල් මොහොට්ටි | ලේකම් | මාතර ක්‍රීඩා සමාජය | උයන්වත්ත ක්‍රීඩාංගනය, මාතර |

12-23

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය සහ 1975 අංක 4 දරන වීථි හා ස්මාරක නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ 57 වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය සහ 1975 අංක 4 දරන වීථි හා ස්මාරක නම් කිරීමේ හා ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ 57(අ) වගන්තිය ප්‍රකාරව 2021.12.14 දින පවත්වන ලද දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ සම්මත යෝජනාව අනුව සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 119 දෙහිඕවිට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඊරියගොල්ල බෝධිය අසල සිට සමුපකාරය දක්වා මාර්ගය රණවිරු මොනාත් පෙරේරා මාවත ලෙස නම් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

මෙම නම් කිරීම සම්බන්ධයෙන් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේනම් මේ නිවේදනයේ සිට ලිත් මාසයක කාල සීමාවක් ඇතුළත තම විරෝධතාවයන් ලිඛිතව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ජී. දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2021 දෙසැම්බර් මස 22 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-25/1

---

මගේ අංකය : DPS/01/04/05/05

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය සහ 1975 අංක 4 දරන වීථි හා ස්මාරක නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ 57 වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය සහ 1975 අංක 4 දරන වීථි හා ස්මාරක නම් කිරීමේ හා ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ 57(අ) වගන්තිය ප්‍රකාරව 2021.12.14 දින පවත්වන ලද දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ සම්මත යෝජනාව අනුව සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 119 දෙහිඕවිට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙහිඕවිට පිරිවෙණ මාර්ගය පූජ්‍ය හැවැන්පොල විමලවංශ නාහිමි මාවත ලෙස නම් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

මෙම නම් කිරීම සම්බන්ධයෙන් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේනම් මේ නිවේදනයේ සිට ලිත් මාසයක කාල සීමාවක් ඇතුළත තම විරෝධතාවයන් ලිඛිතව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ජී. දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2021 දෙසැම්බර් මස 22 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-25/2

# විවිධ දැන්වීම්

## කොළඹ මහා නගර සභාව

1979 අංක 42 සහ 1985 අංක 20 දරන මහා නගර සභා සංශෝධන පනත්වලින් සංශෝධිත මහා නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය) 247 අ, 247 ආ, 247 ඇ සහ 247 ඉ යන වගන්ති යටතේ කොළඹ මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා පනවා ඇති බලපත්‍ර ගාස්තු සහ බදු අය කිරීම.

2021.12.13 වැනි දින පවත්වන ලද කොළඹ මහා නගර සභාවේ අංක 2576 දරන සභා සම්මුතිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා කොළඹ මහ නගර සභාව විසින් පනවා අය කිරීමට ඇති වෙළෙඳ බලපත්‍ර ගාස්තු කර්මාන්ත විෂයෙහි සහ/හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයෙහි බදු සහ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම පිළිබඳව ගාස්තු චක්‍රයක් පහත දැක්වෙන උපලේඛනයෙහි (1), (2), (3), (4) අනුපිළිවෙළින් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම ගාස්තු 2022.12.31 දක්වා බල පැවැත්වේ.

2022 වර්ෂය සඳහා ගෙවිය යුතු මෙම බලපත්‍ර ගාස්තු සහ බදු මුදල් 2022 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බව මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රෝසි සේනානායක,
නගරාධිපතිනි,
කොළඹ මහා නගර සභාව.

2021 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.

### උපලේඛන අංක 01

247 "අ" වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුව

(අ) බලපත්‍ර ගාස්තු චක්‍රය :

| *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | *බලපත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|
| 1,500 0 නොඉක්මවන විට | 2,000 0 |
| 1,500 0 ඉක්මවන නමුත් 2,500 0 නොඉක්මවන විට | 3,000 0 |
| 2,500 0 ඉක්මවන විට | 5,000 0 |

(ආ) ස්ථානය භාවිතා කරනු ලබන බලපත්‍රය ලබාගත යුතු කාර්යයන් සම්බන්ධ ලැයිස්තුව :

1. මිනිරන් සකස් කිරීම හා ශ්‍රේණි කිරීම.
2. මිනිරන් ගබඩා කිරීම.
3. පොහොර නිෂ්පාදනය
4. පොහොර ගබඩා කිරීම
5. හම් ගබඩා කිරීම/නිෂ්පාදනය කිරීම.
6. කිලෝග්‍රෑම් 250 ට වඩා උම්බලකඩ ගබඩා කිරීම.
7. කුකුළන් ඇති කිරීම.
8. කළුගල් හෝ කබොක් ගල් හෑරීම.
9. බොරළු හෑරීම.

10. හරකුන් හෝ අශ්වයන් සඳහා මඩුවක් හෝ ඉස්තාලයක් පැවැත්වීම.
11. සත්ත්ව රෝහලක් පැවැත්වීම.
12. රබර් සකස් කිරීම.
13. මයිකා ශුද්ධ කිරීම.
14. බැටළුවන් සහ/ හෝ එළුවන් 10 ක් හෝ වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
15. උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
16. කරඳමුංගු/කෙඳි/කුරුඳු/ගෙන්දගම් දුම යොදා සකස් කිරීම.
17. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1,250 ට වඩා ගබඩා කිරීම.
18. ඔට්ටපාලු ඇඹරීම හා වේලීම.
19. ට්‍රන්ක පෙට්ටි හෝ/සහ සූට්කේස් නිෂ්පාදනය කිරීම.
20. ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විෂබීජනාශක නිෂ්පාදනය කිරීම.
22. ටයර් නැවත පිරවීමේ හෝ කට්ටා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. කුරුඳු කිලෝ ග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
24. කොකෝවා කිලෝ ග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
25. ලී බඩු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
26. මැණික් කැපීම සහ/හෝ දියමන්ති ඔප දැමීම. (මැණික් ව්‍යාපාරිකයන් විසින්)
27. බලයලත් වෙළෙඳුන් විසින් රබර් ගබඩා කිරීම.
28. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීම.
29. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
30. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම.
31. පිටි හෝ කුළුබඩු වර්ග ඇඹරීම.
32. වාණිජමය කටයුතු සඳහා සත්ත්ව ආහාර පිණිස කිලෝග්‍රෑම් 1000 කට වඩා ධාන්‍ය ගබඩා කිරීම (සමූපකාර ගබඩාවන් හැර)
33. රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
34. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කිරීම.
35. යන්ත්‍ර මගින් ඇටකටු ඇඹරීම.
36. පොලිතින්, සැලෝලයිට් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
37. ලීටර් 25 ට වඩා සහ/හෝ කිලෝ ග්‍රෑම් 20 ට වඩා අම්ල වර්ග (ඇසිඩ්) සහ/හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම.
38. පාවහන්/පාවහන් කොටස් සහ/හෝ බූට්ස් නිෂ්පාදනය කිරීම.
39. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම.
40. වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, විදුලි බලයෙන් හෝ යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
41. සිසිල් බීම/ පළතුරු බීම/ සෝස් වර්ග නිෂ්පාදනය කිරීම.
42. කොප්පරා ගබඩාවක් තබා ගැනීම.
43. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම.
44. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය කිරීම.
45. තෙල් සිඳීම පිණිස සෙක්කුවක් හෝ අතින් ක්‍රියා කරවන මෝලක් පැවැත්වීම.
46. රෙදි වර්ග නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
47. ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම.
48. පුළුන් ගබඩා කිරීම.
49. ලීටර් 225 කට වඩා පොල්තෙල් ගබඩා කිරීම.
50. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම.
51. ඇසිටිලින් සහ/හෝ ඔක්සිජන් නිෂ්පාදනය කිරීම.
52. උළු 500 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
53. ගඩොල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
54. කබොක් ගල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
55. සිගරට් නිෂ්පාදනය කිරීම.
56. බීඩි සහ/හෝ සුරුට්ටු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
57. කිලෝග්‍රෑම් 250 ට වඩා ලී පෙට්ටි ගබඩා කිරීම.
58. කොහු නිෂ්පාදනය කිරීම.

59. රස කැවිලි නිෂ්පාදනය කිරීම.
60. අඟුරු සහ/හෝ පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
61. බෝට්ටු හෝ බත්තල් නිෂ්පාදනය කිරීම.
62. ලී පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
63. මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම කරන ගරාජයක් හැර යකඩ සහ/හෝ වානේ වැඩපොලක් පවත්වාගෙන යාම.
64. මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම/ කරන ගරාජයක් හැර ඔක්සිජන් වෑල්ඩිං සහ විදුලි වෑල්ඩිං පොළක් පවත්වාගෙන යාම.
65. මෝටර් රථවාහන අළුත්වැඩියා කරන ගරාජයක් පවත්වාගෙන යාම.
66. මෝටර් රථවාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
67. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවකයින් 25 හෝ ඊට වැඩි)
68. පොල්තෙල් හැර වෙනත් ඕනෑම වර්ගයක තෙල් ලීටර් 50 ට වඩා ගබඩා කිරීම.
69. ගෙන්දගම් සහ/හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
70. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම.
71. පතරොම් 100 ට වඩා ගබඩා කිරීම.
72. කොහු/මෙට්ට/කොට්ට/කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
73. අලුත් ටයර් හෝ ටියුබ් 50 කට වඩා ගබඩා කිරීම.
74. විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
75. විදුලි බලයෙන් හැර යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
76. යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
77. කමිස කරපටි සහ කමිස අත් සකස් කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
78. ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. ගෑස්/ගල් අඟුරු ගෑස් නිපදවීම, ගබඩා කිරීම හෝ වෙළෙඳාම් කිරීම.
80. අම්ලකර වායු බල කම්හලක් පවත්වාගෙන යාම.
81. යපස් උණු කිරීම.
82. රතිඤ්ඤා ගබඩා කිරීම.
83. කිලෝග්‍රෑම් දෙකකට වඩා වෙඩි බෙහෙත් ගබඩා කිරීම.
84. මේද, ඉටි වර්ග, මැලියම් වර්ග ගබඩා කිරීම.
85. ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීම.
86. තාර පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. ශීතකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නැවත සකස් කිරීම, සහ පරීක්ෂා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
88. මෝටර් කාර් රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. මෝටර් බයිසිකල් හෝ ස්කූටර් හෝ ත්‍රීරෝද රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. අතුනුබහන් හා සත්ත්ව තෙල් උණු කිරීම.
91. සබන් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
92. තෙල් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
93. රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. දේශීය බෙහෙත් ද්‍රව්‍ය යොදා බීම වර්ග නිෂ්පාදනය කිරීම හා විකිණීම.
96. සවි නිෂ්පාදනය කිරීම.
97. වෙඩි බෙහෙත් නිෂ්පාදනය කිරීම.
98. ගිණිකෙළි නිෂ්පාදනය කිරීම.
99. පිදුරු ගබඩාවක් පවත්වාගෙන යාම.
100. ඇටකටු ගබඩාවක් පවත්වාගෙන යාම.
101. ගිනි ගන්නා සුළු තෙල් ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
102. පපඩම් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
103. හෝටලයක් පවත්වාගෙන යාම.
104. ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම.
105. කිරි පට්ටියක් පවත්වාගෙන යාම.

106. ධාන්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
107. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
108. පුන්නක්කු කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
109. පුන්නක්කු හැර වෙනත් සත්ත්ව ආහාර කිලෝගෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
110. අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
111. පොහොර, මිනිරන්, අළුහුණු බහාලීම සඳහා පාවිච්චි කරන ලද ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
112. පුවක් ශුද්ධ කර දීම.
113. පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම හෝ ඒ හා ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම.
114. පරණ යකඩ ගබඩා කිරීම.
115. ග්ලූ හා ගම් වර්ග නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
116. බැටරි නැවත පිරවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
117. හිස් බෝතල් 100 ට වඩා ගබඩා කිරීම.
118. මිනී පෙට්ටි නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
119. කපුරු නිෂ්පාදනය කිරීම.
120. පොහොර, හුණු, මිනිරන් බහාලීම සඳහා පාවිච්චි නොකරන ලද ගෝනි 100 ට වඩා ගබඩා කිරීම.
121. පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 100 ට වඩා ගබඩා කිරීම.
122. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම.
123. අලුත් සහ/හෝ පරණ කඩදාසි කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
124. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු නොලබන විද්‍යුත් ආලේපනය, ක්‍රෝමියම් ආලේපනය, රන් ආලේපනය, රිදී ආලේපනය හෝ තඹ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
125. දර මඩුවක් පවත්වාගෙන යාම.
126. හකුරු නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
127. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවක සංඛ්‍යාව 25 ට අඩු)
128. බොම්බයි එළුණු කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
129. අර්තාපල් කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
130. කරවල කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
131. ජාඩි කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
132. ඇඳුම් ඩ්‍රයි ක්ලීන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
133. කෝපි හෝ තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම.
134. කෑම විකුණන ස්ථානයක් හා/හෝ බත් කඩයක් පවත්වාගෙන යාම. (හුදෙක්ම සාමාජිකයින් සඳහා පමණක්ම සුභ සාධක සංගම් මගින් පවත්වන ආපන ශාලා බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් ය.)
135. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම.
136. භෝජනාගාරයක් හා/හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම.
137. බේකරියක් පවත්වාගෙන යාම.
138. බාබර් සාප්පුවක් සහ/හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. (සම්භාහන මධ්‍යස්ථාන හැර)
139. ලොන්ඩරියක් පවත්වාගෙන යාම.
140. හුණු ගබඩා කිරීම.
141. ටයර්, ටියුබ්, වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
142. බන්ඩිත ගුදම් පවත්වාගෙන යාම.
143. සීනි ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
144. තිරිඟු පිටි ගබඩා කිරීම සහ/ හෝ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
145. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. යන්ත්‍රානුසාරයෙන්, විදුලි බලයෙන් හෝ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන කුමන අන්දමක හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
147. මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගන්නා සියලුම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම.
148. දේශීය හෝ බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීම.
149. අවමංගල ශාලාවක් පවත්වාගෙන යාම
150. මෘත ශරීර කල් තබා ගැනීමේ/සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (එම්බාම් කිරීමේ)

(ඇ) (1) ලංකා සංචාරක මණ්ඩලයේ (වර්තමාන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ) ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය මගින් අනුමත කර ඇත්තා වූ හෝ හෝටල්වලින්, නවාතැන්පලවල්වලින් හෝ ආපනශාලාවලින් අදාළ හෝටලයේ, නවාතැන්පොලේ හෝ ආපනශාලාවේ පසුගිය වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට දශම එකක (0.1%) බලපත්‍ර ගාස්තුවක් 2022 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීම.

*උපලේඛන අංක 02*

247 "ආ" වගන්තිය යටතෙහි ව්‍යාපාර හෝ කර්මාන්ත විෂයෙහි බදු

| *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)* | *බලපත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|
| 1,500 0 නොඉක්මවන විට | 2,000 0 |
| 1,500 0 ඉක්මවන නමුත් 2,500 0 නොඉක්මවන විට | 3,000 0 |
| 2,500 0 ඉක්මවන විට | 5,000 0 |

(ආ) කර්මාන්ත ලැයිස්තුව :

1. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. කාර්යාල බඩු බාහිරාදිය ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
3. පාවිච්චි කළ සහ/හෝ අලුත් මෝටර් රථ ගෙන්වීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. අලුත් හෝ පාවිච්චි කරන ලද මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. ශීතකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. රූපවාහිනි යන්ත්‍ර ගෙන්වීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. බටහිර ඖෂධ වර්ග වෙළෙඳාම් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. බලයලත් මත්පැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. බිස්කට් සහ/හෝ ටින් කෑම වර්ග විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම.
11. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
12. රෙදිපිළි වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම.
13. භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. බයිසිකල් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. මෝටර් සයිකල් සහ/හෝ ස්කූටර් හා/හෝ ත්‍රීරෝද රථ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. චිනච්චට්ටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. වායු සමීකරණ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මාළු අල්ලන දැල් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. සබන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විවිධ භාණ්ඩ නැව්ගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. රෙදිපිළි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. මැණික් සහ/හෝ දියමන්ති කැපීමේ හා පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම.
24. ඉවතලන නූල් හෝ ජූට් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය අපනයනයට සහ/හෝ ආනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
27. කැසට් පටිගත කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. මහන මැෂින් ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. පරිගණක යන්ත්‍ර ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. චංචල හෝ නිශ්චල දේපළ විකිණීමේ ස්ථානයක්/ආයතනයක් පවත්වාගෙන යාම.

31. ඇස් කණ්ණාඩි නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
32. ලාම්පු ආවරණ නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
33. යකඩ බඩු විකිණීමේ ස්ථානයක් /ආයතනයක් පවත්වාගෙන යාම.
34. මැණික් හා දියමන්ති වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. තොග වශයෙන් කොහු ලණු ගබඩා කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. ඉටිපන්දම් ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ සහ /හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. විදුලිබල උත්පාදන යන්ත්‍ර කුලියට දීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. අලුත් ටයර්, ටියුබ් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
41. සිගරැට් හෝ බීඩි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. වාණිජමය කාර්යයන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
44. ඔරලෝසු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. බීජ වර්ග සහ/ හෝ පැළ වර්ග වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. ගුවන් සේවා කාර්යාලයක් පවත්වාගෙන යාම.
47. සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
48. විදේශ රැකියා සැපයීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම.
49. කන්ටේනර් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ හෝ ගබඩා කිරීමේ අංගනයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම.
50. රූපවාහිනි යන්ත්‍ර හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
51. සුරතලය සඳහා ඇති කරන මසුන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙනයාම.
53. නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම.
54. අභ්‍යන්තර පණිවුඩ හුවමාරු කිරීමේ උපකරණ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
55. ආයුර්වේද ඖෂධ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
56. මුළුතැන්ගෙයි උපකරණ ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. ඡායාරූප දල සේයාපට සේදීමේ සහ මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58. සනීපාරක්ෂක උපකරණ සහ/හෝ පිඟන් ගඩොල් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59. බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ලිපිද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61. ජල පොම්ප හා උපාංග වෙළෙඳාම් කිරීම.
62. අකුරු කෙටීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.
63. සිසිල් බීම වෙළෙඳාම් කිරීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. විකිණීම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ/හෝ අංගනයක් පවත්වාගෙන යාම.
65. යකඩ තහඩු හා ඇලුමිනියම් තහඩු ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම.
66. බුමුතුරුණු සහ ෆෝමිකා ෂීට්ස් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. ධීවර ආම්පන්න වෙළෙඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. කළුගල් ආශ්‍රිතව සමරු ඵලක සහ/හෝ ෆ්ලෝ ටයිල්ස් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
70. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71. පිඟන් බඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. තෑගි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. ආහාර ද්‍රව්‍ය සහ කුළුබඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. වාණිජමය කටයුතු සඳහා ආයතනයක් හෝ කාර්යාලයක් පවත්වාගෙන යාම.
75. දුම්කොල ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

76. දේශීය සහ/හෝ විදේශීය ආනයනික හෝ අපනයනික භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. කිරිගරුඬ සහ/හෝ කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80. කෞතුක භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම (ග්‍රොසරි).
82. සාප්පු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම.
83. ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. අත් යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
85. පොත් පත් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. අරුමෝසම් බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් සහ/හෝ සැරසිලි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. වීඩියෝ කැසට් පට වෙළෙඳාම් කිරීම සහ/හෝ කුළියට දීම.
88. පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. තරාදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. සංගීත භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
91. හිස් බැරල් ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මංගල හෝ අවමංගල කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීම හෝ කුලියට දීම.
93. බිත්තර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සිහිවටන නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
96. සෙල්ලම් බඩු ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97. මල් සාප්පුවක් පවත්වාගෙන යාම.
98. ප්‍රචාරක දැන්වීම්, අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
99. ගොවි උපකරණ ආම්පන්න වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
100. දුරකථන/ටෙලෙක්ස් පණිවුඩ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
101. වෛද්‍ය උපකරණ ආනයනය කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
102. පපඩම් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
103. පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
104. කිරි ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
105. කඩල වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
106. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
107. හැලි වලං සහ/හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
108. පළතුරු වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
109. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
110. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
111. එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
112. කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
113. කට්ටකුමංජල් ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
114. මල් පෝච්චි සහ/හෝ විවිධ පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
115. කැටයම් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
116. ගිනි නිවීමේ ආම්පන්න සහ හෝ ආශ්වාස ප්‍රාශ්වාස උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
117. කාර්යාල උපකරණ විකිණීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
118. පරිගණක පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
119. ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
120. රිය පැදවීම පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
121. දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම.

122. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
123. උපදේශක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
124. සංචාරක බස් සේවා ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.
125. බඩු ප්‍රවාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
126. දේශීය හා විදේශීය බැංකු ආයතන පවත්වාගෙන යාම.
127. රක්ෂණ සමාගම් පවත්වාගෙන යාම.
128. යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
129. කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
130. කැඩපත් සහ/හෝ ගොඩනැගිලි වීදුරු වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
131. සම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
132. ප්ලාස්ටික් භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
133. සුවඳ විලවුන් වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
134. පාවිච්චි කරන ලද ටයර්, ටියුබ් සහ පුරවන ලද ටයර් ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
135. රසායනාගාර උපකරණ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
136. පරිගණක මගින් මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
137. ඇලුමිනියම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
138. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
139. ඉරන ලද ලී ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
140. මැටි භාණ්ඩ නිෂ්පාදනය විකිණීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
141. පාන් වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
142. බතික් රෙදි නිෂ්පාදනය කිරීම සහ/හෝ විකිණීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
143. රථ වාහන රෝද සමබර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
144. කුඩ නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
145. නූල් නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. තේ කුඩු ගබඩා කිරීම සහ/හෝ පැකට් කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
147. ලී බඩු වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
148. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
149. ප්ලාස්ටික් භාණ්ඩ සහ/හෝ ෆයිබර් ග්ලාස් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
150. පෞද්ගලික සාත්තු නිවාසයක් හෝ රෝහලක් පවත්වාගෙන යාම.
151. ලොරි බොඩි සහ අනෙකුත් වාහන සඳහා බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
152. විනාකිරි නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
153. ශීත කළ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
154. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
155. ගිනි අවි වෙළඳාම් කිරීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
156. වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
157. විවිධ එසෙන්ස් වර්ග නිෂ්පාදනය කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
158. ප්ලාස්ටික් වැනි දෑ උපයෝගී කරගෙන ක්‍රීඩා භාණ්ඩ/ විසිතුරු භාණ්ඩ හෝ වෙනත් විවිධ දෑ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
159. රසායනික ද්‍රව්‍ය සහ/හෝ රසායනාගාර උපකරණ නිෂ්පාදනය කිරීමේ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
160. උත්සව සඳහා කෑම වර්ග සහ/හෝ සිසිල් බීම නිෂ්පාදනය කිරීම සහ සැපයීම.
161. කපාපු පොල් වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
162. ඛණිජ වර්ග වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
163. පූජා භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
164. වැලි සහ/හෝ කළුගල් ගබඩා කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

165. දියලුණු කි.ග්‍රෑ. 1,000 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
166. කිරිහලක් පවත්වාගෙන යාම.
167. කාර් හුඩ් සහ ආසන සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
168. හඳුන්කූරු නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
169. මී පැණි/ පොල් පැණි/ කිතුල් පැණි/ හෝ වෙනත් පැණි වර්ග සෑදීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
170. කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
171. අවුල්පත් (රසකැවිලි) සහ /හෝ කෙටි කෑම වර්ග වෙළඳසලක් පවත්වාගෙන යාම.
172. රබර් සීල් සහ/හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
173. ලෝහ සහ/හෝ ගැල්වනයිස් යකඩ තහඩුවලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
174. නූඩ්ල්ස් සෑදීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
175. මයින හමක් සහ ඒ හා සමාන උපකරණයක් භාවිතා කිරීමේ ස්ථානයක් (කම්හලක්) පවත්වාගෙන යාම.
176. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සහ/හෝ ප්‍රදර්ශනය කිරීම සහ/හෝ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
177. රථ වාහන ගාලක් පවත්වාගෙන යාම.
178. පරිගණක සහ දුරකථන ආශ්‍රිත අන්තර්ජාල සේවා හා ඊ මේල් සේවා ඇතුළත් සයිබර් කැෆේ ආයතනයක් පවත්වාගෙන යාම.
179. බෝතල්ගත කරන ලද වතුර විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
180. උත්සවශාලා කුලියට දීම.
181. රථවාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
182. වාහන බර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
183. භාණ්ඩ නිෂ්කාශණය කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම.
184. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
185. කෘත්‍රිම මල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
186. මහා නගර සභා ආඥාපනතේ 247 අ හෝ 247 ඈ වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයයෙහි බදු නොගෙවන ඉහතින් සඳහන් නොවූ වාණිජ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
187. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
188. පරිගණක අළුත්වැඩියා කිරීමේ හා උපාංග සහ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
189. ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ, විකිණීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
190. රබර් සීල් හා යකඩ මුද්‍රා නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
191. නාවික කටයුතු සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම.
192. විදුලි බිල් අයකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
193. අළුත් යකඩ වෙළෙඳාම/ගබඩා කිරීම.
194. බෝතල්ගත කරන ලද ලිහිසි තෙල් වෙළඳාම.
195. විදේශ මුදල් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.

**උපලේඛන අංක 03**

247 "(ඈ)" වගන්තිය යටතෙහි පනවා ඇති වෙළඳ ව්‍යාපාර විෂයෙහි බදු

(අ) බදු චක්‍රය

| | *I වැනි තීරුව*<br>*වෙළඳ ව්‍යාපාරයෙන් ගතවූ වර්ෂයේදී ලත් ලැබීම්*<br>*රු.* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

(ආ) බදු පනවන ලැබූ ව්‍යාපාර ලැයිස්තුව :

1. කොමිස් ඒජන්තවරු
2. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
3. මුදල් ණයට දෙන්නන්
4. බ්‍රෝකර්වරු
5. වෙන්දේසිකරුවන්
6. මුදල් ආයෝජකයින්
7. රන් බඩු උකස් ගන්නන්
8. උපදේශකවරුන්

**උපලේඛන අංක 04**

1985 අංක 20 දරන මහා නගර සභා (සංශෝධන) පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 "ඉ" වැනි වගන්තිය යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයයෙහි බදු අය කිරීම.

*කොළඹ මහා නගර සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අනුයෝජකයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණ මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් කෙනෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් එසේ ඒ ඉඩම විකුණාලත් මුදලින් සභාවට ගෙවිය යුතුය.*

සටහන :

2022 වසර සඳහා ඉහත සඳහන් ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමේ දී පහත දැක්වෙන පදනම මත ක්‍රියාත්මක වනු ඇත.

1. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි කිහිපයක එකම ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

2. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාරය හෝ කර්මාන්තය සඳහා යොද ගෙන ඇති බිම් ප්‍රමාණය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. එක් පුද්ගලයෙකු විසින් එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක් වුව ද එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා ව්‍යාපාර බදු හෝ බලපත්‍ර ගාස්තු අය කරනු ඇත. එසේ වුව ද එම ස්ථානයේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද උපරිමය රුපියල් 5,000 ට අඩු වන්නේ නම් එවැනි අවස්ථාවක අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරු අනුව බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. එක් පුද්ගලයෙකු විසින් වරිපනම් අංක කිහිපයක, විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වුව ද තම එක් එක් ව්‍යාපාරය හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ පුද්ගලයින් කිහිප දෙනෙකු ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොද ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණය අනුව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ලැබේ.

01-35

## නෙළුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය**

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබුවා වූ ද, 2010.11.26 දින සිට වලංගු වන බව පිළිගැනීමට 2010.10.19 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ දී ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ නෙළුව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන ව්‍යාපාරය/කර්මාන්තය සම්බන්ධයෙන් වන විට දී එයට ඉදිරියෙන් II වැනි තීරයේ දැක්වෙන එකී ව්‍යාපාරය කර්මාන්තය/කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ හෝ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකමට අදාළව දැක්වෙන බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය/ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා වූ ද වන අවස්ථාවක ඉහත කී උපලේඛනයේ II වැනි තීරයේ කුමක් සඳහන් වුව ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පලේ 2021 වර්ෂය තුළ ලැබූ ආදායමින් 1%ක් විය යුතු බවත් නෙළුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *I තීරය* | | *II තීරය* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | සිසිල් බීම කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | කිරි පට්ටි | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | අයිස් කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |

| | *I තීරය* | *II තීරය* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක ගාස්තුව* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 08. | බත් කඩ, ආපනශාලා සහ තේ, කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | හෝටලයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | නවාතැන්පළක් (ගෙස්ට් හවුස්) | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ආහාර පාන වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | වෙළෙඳපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |

01-36/1

---

## නෙළුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය**

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ I වන කොටසේ දැක්වෙන යම් ව්‍යාපාරයක් නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ලැබූ ආදායම මෙහි පහත උපලේඛනයේ II වන කොටසේ I තීරයේ සඳහන් සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ ඊට අනුරූපිත අනුප්‍රමාණයට අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නෙළුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධානය කිරීමට මෙම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

## උපලේඛනය

I වැනි කොටස :

1. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
2. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
3. තොග වෙළඳසැලක් පවත්වාගෙන යාම
4. රෙදිපිළි හෝ නිමි ඇඳුම් වෙළඳසැලක් පවත්වාගෙන යාම
5. පාවහන් අලෙවි සැලක් පවත්වාගෙන යාම
6. තෑගි භාණ්ඩ හෝ සාප්පු බඩු වෙළඳාම
7. විදුලි උපකරණ වෙළඳාම
8. යකඩ භාණ්ඩ හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම
9. වාහන අමතර කොටස් වෙළෙඳාම
10. පා පැදි/යතුරු පැදි අලෙවි කිරීම
11. ඉඩම් හෝ වෙනත් දේපළ වෙළෙඳාම් කිරීම
12. වාහන හෝ යන්ත්‍ර උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
13. පා පැදි/යතුරු පැදි අළුත්වැඩියාව
14. ලී බඩු/කාර්යාල උපකරණ අලෙවි සලක් පවත්වාගෙන යාම
15. අරක්කු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
17. භාණ්ඩ එක්රැස් කිරීම හා විකිණීම
18. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
19. ඡායාරූප වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
20. තීන්ත/සායම් ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
22. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
23. බටහිර ඖෂධ අලෙවි සැලක් (ෆාමසියක්)
24. වෛද්‍ය රසායනාගාර
25. පරිගණක හෝ පරිගණක උපාංග වෙළෙඳාම
26. අපනයන බෝග නිෂ්පාදනය එකතු කිරීම හා විකිණීම
27. කුළු බඩු එකතු කිරීම හා විකිණීම
28. බැංකු හෝ මූල්‍ය ආයතන
29. රක්ෂණ ආයතන
30. කුළී රථ සේවා පවත්වාගෙන යාම
31. ස්වර්ණාභරණ අලෙවිය
32. උත්සව/භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
33. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
34. රේස් හා ඔට්ටු ඇල්ලීමේ ආයතන පවත්වාගෙන යාම
35. රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
36. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
37. ලිපිද්‍රව්‍ය පොත් අලෙවි සැලක් පවත්වාගෙන යාම
38. සංස්කෘතික/ක්‍රීඩා උපකරණ විකිණීම
39. ඉරූ දැව හෝ සකස් කළ වෙළෙඳාම
40. ජංගම දුරකථන අලෙවිය හෝ අළුත්වැඩියාව
41. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
42. එළවළු, පලතුරු වෙළෙඳාම
43. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
44. දුරකථන සම්ප්‍රේෂණ කුලුණක් පවත්වාගෙන යාම
45. ඉහතින් සඳහන් නොවන හා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් තුළින් විකිණීම හෝ කොමිස් පදනමින් ඉපයීමක් සිදු කරනු ලබන වෙනත් ඕනෑම ව්‍යාපාරයක්.

II වැනි කොටස

| *I* වැනි තීරුව | *II* වැනි තීරුව රු. ශත |
|---|---|
| 1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විටක | 90 0 |
| 3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විටක | 180 0 |
| 4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විටක | 360 0 |
| 5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විටක | 1,200 0 |
| 6. රු. 1,50,000 ඉක්මවන නමුත් රු. 1,75,000 නොඉක්මවන විටක | 2,000 0 |
| 7. රු. 1,75,000 ඉක්මවන නමුත් රු. 2,00,000 නොඉක්මවන විටක | 2,500 0 |
| 8. රු. 2,00,000 ඉක්මවන විට | 3,000 0 |

01-36/2

---

**නෙළුව ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්තිය**

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද අය කිරීම සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් පරිදි අක්කර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට ප්‍රථම ගෙවන විට දී එකී බදු මුදලින් 10%ක වට්ටමක් ද, කාර්තු පදනමින් ගෙවන විට නියමිත කාර්තුවේ පළමු මාසය තුළ දී බදු මුදල් ගෙවනු ලබන විටක දී බදු මුදලින් 5%ක වට්ටමක් ලබා දිය යුතු බවටත් නෙළුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *ඉඩමේ ප්‍රමාණය* | *බදු ප්‍රමාණය වර්ෂයකට රු. ශත* |
|---|---|
| හෙක්ටයාර් 5 කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩුවන අවස්ථාවක | 50 0 |
| හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක | 10 0 |

01-36/3

**නෙළුව ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

**267 වැනි අධිකාරය වූ 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත**

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

267 වැනි අධිකාරය වූ 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව නෙළුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට විස්සක (20%) බද්දක් පනවා අයකළ යුතු යැයි ද, එකී යෝජනාව පළාත් පාලන විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන්, පසු ඒ බව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමකින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු බවත් මෙම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01-36/4

---

**නෙළුව ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු පැනවීම

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (1) වැනි වගන්තිය**

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (1) වගන්තිය යටතේ නෙළුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මෙම සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා : | |
| | (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | 18 0 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (vi) | සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොගෙවා ඇති කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් වේ.

3. මෙම උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

01-36/5

---

**නෙළුව ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු පැනවීම සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 39 ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් ගණනය කරනු ලබන ගාස්තුවක් පනවා අය කිරීමට මෙම සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *දැන්වීම් පුවරුවේ ස්වභාවය* | *වර්ග අඩියක් සඳහා රු. ශත* |
|---|---|
| බිත්තියක් මත හෝ වෙනත් නිර්මිත පුවරුවක් මත කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා (වාර්ෂික හෝ කොටසක් සඳහා) | 75 0 |
| ප්‍රචාරක බැනර් ප්‍රදර්ශනය සඳහා (මසක් හෝ ඉන් කොටසක් සඳහා) | 35 0 |

01-36/6

---

**නෙළුව ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අයකිරීම

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වන දිනැති මාසික සභා රැස්වීමෙහි යෝජනා අංක 5.7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. ජී. සුනිල්,
සභාපති,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2021 සැප්තැම්බර් මස 30 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කාරණය* | *අයකරන ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01. | ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 02. | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 03. | ගොඩනැගිලි අයදුම්පත් මත අනුකූලතා සහතිකයක් සඳහා - ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 1,000 0 |
| | පදිංචි ස්ථානයකට | 1,000 0 |
| 04. | ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කරගැනීම සඳහා (වසරකට) | 1,000 0 |
| 05. | වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු | 1,000 0 |
| 06. | කැබලි සැලසුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු | 1,000 0 |
| 07. | කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු - එක් කැබැල්ලකට (එකකට වැඩි සෑම කැබැල්ලකටම රු. 500ට අමතරව රු. 200 බැගින් ගෙවිය යුතු ය.) | 500 0 |
| 08. | මහජන ක්‍රීඩාංගනය එක් දිනකට ලබාදීමේ ගාස්තු | 5,000 0 |
| 09. | පැරණි සතිපොළ භූමිය එක් දිනකට ලබාදීමේ ගාස්තු | 2,000 0 |
| 10. | නෙළුව පොදු වෙළඳපොල ඉදිරිපිට භූමිය එක් දිනකට ලබාදීමේ ගාස්තු | 2,000 0 |
| 11. | බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළියට ලබාදීමේ ගාස්තුව - පැයක් සඳහා | 2,500 0 |
| 12. | ජල බවුසරය දිනකට ලබාදීමේ ගාස්තුව (ට්‍රැක්ටර් බවුසරය) | 3,000 0 |
| 13. | ජල බවුසර් දිනකට ලබාදීමේ ගාස්තුව (ට්‍රක් බවුසරය) | 10,000 0 |
| 14. | විදුලි උත්පාදන යන්ත්‍රය දිනකට ලබාදීමේ ගාස්තුව | 5,000 0 |
| 15. | කොන්ක්‍රීට් මිශ්‍රණය දිනකට ලබාදීමේ ගාස්තුව | 5,000 0 |
| 16. | පස් තලන යන්ත්‍රය දිනකට ලබාදීමේ ගාස්තුව | 1,500 0 |
| 17. | ෆෝටෝන් ටිපර් රථය දිනකට ලබාදීමේ ගාස්තුව | 15,000 0 |
| 18. | ශ්‍රවනාගාරය දිනකට ලබාදීමේ ගාස්තු | 7,000 0 |
| 19. | 2" ජල මෝටරය දිනකට ලබාදීමේ ගාස්තුව (ජල ගිල්වන ) | 2,500 0 |

| | | |
|---|---|---|
| 20. | පුස්තකාලය සඳහා සාමාජික තැන්පත් ගාස්තු | 150 0 |
| 21. | පුස්තකාල පොත් සඳහා දිනකට ප්‍රමාද ගාස්තු | 5 0 |
| 22. | පුස්තකාල සාමාජික ගාස්තුව (වර්ෂයකට අළුත් කිරීම) | 50 0 |
| 23. | කොන්ක්‍රීට් අච්චු (කර්මාන්ත සඳහා සාම්පල් ලබාගැනීම සඳහා) දිනකට ලබාදීමේ ගාස්තුව) | 500 0 |
| 24. | අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත් ලිපිගොණුවක පිටපතක් ලබාගැනීම | 500 0 |
| 25. | අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුමක පිටපතක් ලබාගැනීම | 1,000 0 |

ගලි බවුසර් සේවය ලබාදීමේ දී අයකරනු ලබන ගාස්තු

| *අනු. අංකය* | *කාරණය* | *අයකරන ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1 | නෙළුව නගර සීමාවේ (නෙළුව සිට මාවනාන දක්වා, නෙළුව සිට බටුවංගල හන්දිය දක්වා, නෙළුව සිට පැලවත්ත පාමංකඩ සර්විස් එක දක්වා, නෙළුව සිට ගුරුදියපොත හන්දිය දක්වා) ගෘහ ස්ථානයක එක් වාරයක ඉවත් කිරීමක් සඳහා | 5,500 0 |
| | ස්ථාවර ගාස්තුව | 500 0 |
| | ඉහත සීමාව තුළ එක් ඉවත් කිරීමකට වැඩිවන සෑම ඉවත් කිරීම් වාරයක් සඳහා | 5,000 0 |
| | අමතර ඉවත් කිරීමේ දී වැඩිවන සෑම කිලෝමීටර් 01 ක් සඳහා | 90 0 |
| 2 | නෙළුව නගර සීමාවේ (නෙළුව සිට මාවනාන දක්වා, නෙළුව සිට බටුවංගල හන්දිය දක්වා, නෙළුව සිට පැලවත්ත පාමංකඩ සර්විස් එක දක්වා, නෙළුව සිට ගුරුදියපොත හන්දිය දක්වා) කර්මාන්ත ස්ථානයක එක් ඉවත් කිරීමක් සඳහා | 6,500 0 |
| | ස්ථාවර ගාස්තුව | 500 0 |
| | ඉහත සීමාව තුළ එක් ඉවත් කිරීමකට වැඩිවන සෑම ඉවත් කිරීම් වාරයක් සඳහා | 6,000 0 |
| | අමතර ඉවත් කිරීමේ දී වැඩිවන සෑම කිලෝමීටර් 01 ක් සඳහා | 90 0 |
| 3 | නෙළුව නගර සීමාවේ (නෙළුව සිට මාවනාන දක්වා, නෙළුව සිට බටුවංගල හන්දිය දක්වා, නෙළුව සිට පැලවත්ත පාමංකඩ සර්විස් එක දක්වා, නෙළුව සිට ගුරුදියපොත හන්දිය දක්වා) ව්‍යාපාරික ස්ථානයක, බැංකු හා අනෙකුත් ආයතනයන්හි එක් ඉවත් කිරීමක් සඳහා | 6,500 0 |
| | ස්ථාවර ගාස්තුව | 500 0 |
| | ඉහත සීමාව තුළ එක් ඉවත් කිරීමකට වැඩිවන සෑම ඉවත් කිරීම් වාරයක් සඳහා | 6,000 0 |
| | අමතර ඉවත් කිරීමේ දී වැඩිවන සෑම කිලෝමීටර් 01 ක් සඳහා | 90 0 |
| 4 | නෙළුව නගර සීමාවේ (නෙළුව සිට මාවනාන දක්වා, නෙළුව සිට බටුවංගල හන්දිය දක්වා, නෙළුව සිට පැලවත්ත පාමංකඩ සර්විස් එක දක්වා, නෙළුව සිට ගුරුදියපොත හන්දිය දක්වා) ආගමික ස්ථානයක එක් ඉවත් කිරීමක් සඳහා | 1,500 0 |
| | ස්ථාවර ගාස්තුව | 500 0 |
| | ඉහත සීමාව තුළ එක් ඉවත් කිරීමකට වැඩිවන සෑම ඉවත් කිරීම් වාරයක් සඳහා | 1,000 0 |
| | අමතර ඉවත් කිරීමේ දී වැඩිවන සෑම කිලෝමීටර් 01 ක් සඳහා | 90 0 |
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/9

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ත්‍රිරෝද රථ ගාල් සම්බන්ධව - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 යන වගන්තියේ (vii) (ඌ) කුච්චවේලි ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ෂ 1998/02/13 වන දින පළ කළ *ගැසට් පත්‍රයේ* පිටු අංක (iv) වන වගන්තිය රථ වාහන ගාල් කිරීමේ අතුරු ව්‍යවස්ථාව අංක 06 ප්‍රකාරව පහත දැක්වෙන ස්ථාන "ත්‍රීවිල් රථ ගාල් කරන ස්ථාන" බවත් මෙම ස්ථානවල නතර කරන ත්‍රීවීල් සඳහා වසරකට බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 1,000.00 ක් අය කරන බවත් 2022 වසරට අනුමැති බලපත්‍රය ලබා නොගත් අයට ලබන වසර සඳහා අනුමැතිය ලබා නොදෙන බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,<br>
සභාපති,<br>
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,<br>
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| උපලේඛනය | |
|---|---|
| *අනු. අංකය* | *ත්‍රීවීල් නැවතුම්පළෙහි නම* |
| 1 | පෙරියකුලම් හන්දිය |
| 2 | කොනේෂපුරි හන්දිය |
| 3 | ඉක්බාල් නගර් විශ්වවිද්‍යාල හන්දිය |
| 4 | ඉක්බාල් නගර් ධීවර හන්දිය |
| 5 | නිලාවේලි සමෘද්ධි කාර්යාලයට ඉදිරියෙන් |
| 6 | නිලාවේලි අටේ (08) කණුව හන්දිය |
| 7 | නිලාවේලි ග්‍රාමීය රෝහලට ඉදිරියෙන් |
| 8 | නිලාවේලි ආයුර්වේද රෝහලට ඉදිරියෙන් |

| *උපලේඛනය (සම්බන්ධිතයි...)* | |
|---|---|
| *අනු. අංකය* | *ත්‍රීවීල් නැවතුම්පළෙහි නම* |
| 9 | නිලාවේලි නව වෙළෙඳපොලට ඉදිරියෙන් |
| 10 | නිලාවේලි බීච් හෝටල් හන්දිය ඉදිරිය |
| 11 | වේලූර් හන්දිය |
| 12 | නිලාවේලි ලංකා බැංකුවට ඉදිරියෙන් |
| 13 | ගෝපාලපුර පාසල පාර හන්දිය (A Park) |
| 14 | ගෝපාලපුර සාහිරා හෝටලය ඉදිරිය (B Park) |
| 15 | ගෝපාලපුර කන්නහි අම්මන් කෝවිල ඉදිරිය |
| 16 | ගෝපාලපුර බීච් රිසෝට් ගැලැක්සි හෝටල ඉදිරිය |
| 17 | එරක්කණ්ඩි ධීවර හන්දිය |
| 18 | වාලෙෙඋෟත්තු ආයුර්වේද රෝහලට ඉදිරියෙන් |
| 19 | කුඹුරුපිට හන්දිය පේකා හන්දිය |
| 20 | කුඹුරුපිට හන්දිය |
| 21 | කුච්චවේලි රෝහලට ඉදිරියෙන් |
| 22 | කාසිම් නගර් පල්ලියට ඉදිරියෙන් |
| 23 | ඡායා නගර් පල්ලියට ඉදිරියෙන් |
| 24 | පුඩවකට්ටු පාලම අසල |
| 25 | පුල්මුඩේ ත්‍රිකුණාමල හන්දිය |
| 26 | පුල්මුඩේ රෝහලට ඉදිරියෙන් |
| 27 | පුල්මුඩේ 04 වන කොට්ඨාසයේ දාරුසලාම් පල්ලිය අසල |
| 28 | ඛනිජ වැලි සංස්ථාවට ඉදිරියෙන් |
| 29 | කෝකිලායි මුවදොර අසල |

01-60/10

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

රථවාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 හා පනත 126 යන වගන්තියේ (vii) (උෟ) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2009.12.18 වැනි දින අංක 1638 *විශේෂ ගැසට් පත්‍රයේ* iv වන (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාව විසින් පිළිගැනීමට අනුව එහි අංක 06 දරන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රථගාල් තුළ සභාවේ ලියාපදිංචි කර ඇති ත්‍රිරෝද රථ හැර අනෙකුත් රථවාහන සඳහා පහත උපලේඛනයට අනුව 2022.01.01 වැනි දින සිට අය කිරීමට 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| උපලේඛනය | | | | |
|---|---|---|---|---|
| අනු. අංකය | | වාහනයේ නම | අවසර පත්‍රය සඳහා ගාස්තුව | |
| | | | මාසික ගාස්තුව රු. ශත | වසරකට රු. ශත |
| 1 | ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලත් ත්‍රීවීල් රථ සඳහා | | 300 0 | 3,600 0 |
| 2 | ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලත් ත්‍රීවීල් රථ හැර අනෙකුත් වාහන සඳහා දිනකට | | | |
| | i | වෑන්, කාර්, ජීප් රථ, කැබ් රථ, මෝටර් රථ, ත්‍රි රෝද රථ | 50 0 | |
| | ii | බස් රථ(ලංගම හැර), ලොරි, ටිපර් රථ, ට්‍රේලර් සහිත වෙනත් වාහන | 100 0 | |
| 3 | | වෙනත් මෝටර් වාහන | 75 0 | |
| 4 | | යතුරු පැදි | නොමිලේ | |

01-60/11

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### උත්සව සමයේ රථ ගාල්වලින් ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 යන වගන්තියේ (ix) (ඊ) යන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සභාවට අයත් පරිශ්‍රයන්හි පවත්වන උත්සවවල දී සභාවේ රථ ගාල්වල නතර කරන වාහන සඳහා ගාස්තු පහත උපලේඛනයට අනුව 2022 වසරට අය කිරීමට 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/12

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ක්‍රීඩා පිටි කුළියට දීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සමග කියවිය යුතු හා 126 යන වගන්තියේ (xii) හා (xiv) වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වන වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව සකස් කරන ලද 1988.08.23 වන දින අංක පළාත් පාලන 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv වන (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද පළාත් පාලන අතුරු ව්‍යවස්ථාව කුච්චවේලි ප්‍රාදේශීය සභාව විසින් පිළිගැනීමට අනුව, එකී ව්‍යවස්ථාවේ 02 වන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව 2022 වසර සඳහා කුච්චවේලි ප්‍රාදේශීය සභාව විසින් සභාව සතු ක්‍රීඩාපිටි කුළියට දෙන බවත් ඒ සඳහා ගාස්තු අය කරන බවත් එසේම සභාව සතු ක්‍රීඩාපිටි ප්‍රාදේශීය සභා පනතේ 135 වන වගන්තිය ප්‍රකාරව නිදහස් කිරීමටත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ක්‍රීඩා පිටියේ නම* |
|---|---|
| 1 | ඉක්බාල් නගර් ක්‍රීඩා පිටිය |
| 2 | නිලාවේලි ක්‍රීඩා පිටිය |
| 3 | කුච්චවේලි ක්‍රීඩා පිටිය |
| 4 | පුල්මුඩේ ක්‍රීඩා පිටිය |
| 5 | වෙළෙඳ සංකීර්ණය නිලාවේලි/පුල්මුඩේ කඩ කාමර අනුව |

| | | |
|---|---|---|
| ව්‍යාපාර අරමුණු කරගත් ක්‍රීඩා පිටි සඳහා | රු. 2,000 0 | (දිනකට) |
| ව්‍යාපාර නොවන ඒවා ක්‍රීඩා පිටි සඳහා | රු. 1,000 0 | (දිනකට) |
| පොදු සුභසාධන කටයුතු සඳහා | නොමිලේ | |

01-60/13

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභාව 2022 වසර සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි විය යුතු අතර ඒ සඳහා ලියාපදිංචි ගාස්තු පහත උපලේඛනයට අනුව පනවා අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| උපලේඛනය | | |
|---|---|---|
| *අනු අංකය* | *ලියාපදිංචි කරන අයගේ විස්තර* | *අය කරන ගාස්තුව රු. ශත* |
| 1 | සැපයුම්කරුවෙකු සඳහා | 1,000 0 |
| 2 | කොන්ත්‍රාත්කරුවෙකු සඳහා | 1,000 0 |
| 3 | සැපයුම්කරුවෙකු හා කොන්ත්‍රාත්කරුවෙකු සඳහා | 2,000 0 |

01-60/14

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ මගින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියා කරන වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් හා තැරැව්කරුවන් සේ ක්‍රියා කරන්නන් 2022 වසර සඳහා ලියාපදිංචි විය යුතු බවත් ඒ සඳහා ලියාපදිංචි ගාස්තු පහත උපලේඛනයට අනුව පනවා අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ලියාපදිංචි කරන අයගේ විස්තර* | *අය කරන ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1 | වෙන්දේසිකරුවෙකු සඳහා | 3,000 0 |
| 2 | තැරැව්කරුවෙකු සඳහා | 3,000 0 |
| 3 | වෙන්දේසිකරුවෙකු හා තැරැව්කරුවෙකු සඳහා | 5,000 0 |

01-60/15

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියා කරන ගෘහ නිර්මාණ ශිල්පීන් 2022 වසර සඳහා ලියාපදිංචි විය යුතු බවත් ඒ සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් රුපියල් 5,000 0ක් 2022.03.31 වැනි දිනට පෙර ගෙවා ලියාපදිංචි විය යුතු බවත්, තවද 2021.07.08 වැනි දින අංක 2235/54 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කළ යුතු බවත් 2022.01.01 වැනි දින සිට අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/16

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් මත බදු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 සහ 04 වන උපලේඛනයේ විධිවිධාන වලින් (දින 30ට වැඩි නම් බදු ගෙවිය යුතු බවත් දින 30ට අඩු නම් බදු ගෙවීම අනවශ්‍ය බවත්) වගන්තිය ප්‍රකාරව හා 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වන වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව සකස් කරන ලද 1988.08.23 වැනි දින පළාත් පාලන අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* iv වන (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද පළාත් පාලන අතුරු ව්‍යවස්ථාව කුච්චවේලි ප්‍රාදේශීය සභාව විසින් පිළිගැනීමට අනුව, එකී ව්‍යවස්ථාවේ 40 වන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයට අනුව 2022 වසර සඳහා අය කරන බවත් තවද 148 (3) වගන්තිය ප්‍රකාරව අදාළ ගාස්තු මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර අදාළ උපකාර්යාලයට ගෙවිය යුතු බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|---|
| | | *රු. ශ.* |
| 1. | මෝටර් රථවාහන, ත්‍රීවීල්, ලොරි, පාපැදි, යතුරු පැදි, රික්ෂෝ හැර අනෙකුත් සෑම වාහනයක් සඳහා | 25 0 |
| 2. | සෑම පාපැදියක් හා ත්‍රීවීලරයක් සඳහා - | |
| | (අ) වානිජ ව්‍යාපාරයන් සඳහා | 18 0 |
| | (ආ) වානිජමය නොවන වෙනත් ව්‍යපාර සඳහා | 04 0 |
| 3. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| 5. | සෑම රික්ෂෝවක් සඳහා | 7 0 |
| 6. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| 7. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

මේ සමග අයදුම්පත් ගාස්තු මෝටර් රථ සඳහා රුපියල් 16.00 ක මුදලක් හා වෙනත් ඒවා සඳහා රුපියල් 20.00 මුදලක් අය කරන බව තවදුරටත් දන්වා සිටිමි.

විශ්කම්භය අඟල් 26ක් නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.

මෙම උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මූලික ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත් වේ.

01-60/17

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි

1. ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක
2. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්,
3. එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

එම ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන් ම යටවී ඇති ඉඩම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ ඇති අනුපාතය 2/3ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් ලෙස සැලකෙන ඉඩම මත 153 වගන්තියේ (1) (ඇ) වන උපවගන්තිය යටතේ 2022 වසර සඳහා එක් එක් භූමි ප්‍රාග්ධන අගයෙන් 02% වාර්ෂික බද්දක් අය කිරීමට 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/18

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ඉඩම් සංවර්ධනය කිරීම සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියේ සහ 19 (xxxii) වන උපවගන්ති අනුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම්වලින් පස් හෝ වෙනත් ද්‍රව්‍ය යොදා සංවර්ධනය කිරීමේ දී පහත උපලේඛනයට අනුව 2022 වසර සඳහා ගාස්තු අය කිරීමට සහ පර්චස් 10ක් දක්වා ඉඩම් ගොඩ කිරීමේ දී අඩු ආදයම් ලාභියෙක් නම් වර්ග මීටර් එකකට රුපියල් 30.00 ක මුදලක් අය කරන බවට 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *ඉඩමේ ක්ෂේත්‍ර ඵලය* | *අය කරන ගාස්තුව වර්ග මීටරයක් සඳහා* | |
|---|---|---|---|
| | | *පස් සඳහා රුපියල්* | *වෙනත් ද්‍රව්‍ය සඳහා රුපියල්* |
| 1 | පළමු ව. මී. 300 දක්වා | 100 | 150 |
| 2 | පළමු ව. මී. 300 සිට 750 දක්වා | 400 | 500 |
| 3 | පළමු ව. මී. 750 සිට 1,500 දක්වා | 600 | 700 |
| 4 | පළමු ව. මී. 1500ට වැඩි | 700 | 800 |

01-60/19

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### අක්කර බදු පැනවීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 135 වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් කරන්නා වූද,

01. හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් සඳහාම එකී ඉඩමේ සෑම හෙක්ටයාර එකක් සඳහා 2022 වසර සඳහා රු. 10.00 ක වාර්ෂික බද්දක් අය කිරීමටද,

02. හෙක්ටයාර් පහක් අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු (1-5 අතර) සෑම ඉඩමක් සඳහාම 2022 වසර සඳහා රු. 50.00ක වාර්ෂික බද්දක් අය කිරීමටද,

ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යථෝක්ත වාර්ෂික බද්ද 2022 මාර්තු මස 31, ජුනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් එදිනට පෙර සමාන කොටස් හතරකින් ගෙවිය යුතු බවත්,

තවද නියමිත කාල සීමාව ඉක්මවා බදු මුදල් ගෙවීමේ වරෙන්තු මුදලක් අයකරන බවත් එසේම එකී පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාරව වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් ගෙවූ විට පහත දක්වෙන පරිදි වට්ටම් මුදලක් ප්‍රදනය කිරීමට 2021.09.27වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

(1) 2022 ජනවාරි 31 වන දින හෝ ඊට පෙර සම්පූර්ණ වර්ෂයටම ගෙවිය යුතු බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් සියයට දහයක (10%) වට්ටමක්ද

(2) වරිපනම් බදු මුදල කාර්තු වශයෙන් ගෙවන විට ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවුවහොත් එම මුදලින් සියයට පහක වට්ටමක් (5%) ද ප්‍රදනය කරනු ලැබේ.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/20

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක බද්දක් විකුණුම්කරු, වෙන්දේසිකරු හෝ ඔහුගේ අනු නියෝජිතා විසින් කුච්චවේලි ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු අතර 154(2) (1) වගන්තිය අනුව බද්ද ඉල්ලා සිටීමෙන් පසුව දින 14ක් ඇතුළත ඔහු ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභාව විසින් අදළ අයට අධිකරණමය ක්‍රියාමාර්ග ගන්නා බවත් ඉන් අනතුරුව ඊට අදාළ සියලුම මුදල් ගෙවිය යුතු බවත් 2021.09.27වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/21

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ද්‍රව ප්‍රවාහනය සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ද්‍රව ප්‍රවාහනය කරන වාහනයකින් 2022.01.01 වන දින සිට ප්‍රවාහන වාරයක් සඳහා පහත උපලේඛනයට අනුව ගාස්තුවක් පනවා අය කරන බවත් එම ගාස්තුව සභාවට ගෙවිය යුතු බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| උපලේඛනය | | | | |
|---|---|---|---|---|
| | | *අවසර පත්‍රය සඳහා ගාස්තුව අය කිරීම* | | |
| *අනු අංකය* | *වාහනයේ නම* | *පාලන බල ප්‍රදේශයේ පදිංචි* | *පාලන බල ප්‍රදේශයෙන් පිටත පදිංචි* | |
| | | එක් වාරයකට රු. ශත | එක් වාරයකට රු. ශත | දිනකට රු. ශත |
| 1 | විශාල ලොරියක් සඳහා | 750 0 | 1,000 0 | 3,000 0 |
| 2 | ටිපරයක් සඳහා | 500 0 | 1,000 0 | 2,000 0 |
| 3 | කුඩා ලොරියක් සඳහා | 500 0 | 750 0 | 1,500 0 |
| 4 | ට්‍රැක්ටරයක් සඳහා | 400 0 | 500 0 | 1,000 0 |
| 5 | අත් ට්‍රැක්ටරයක් සඳහා | 200 0 | 200 0 | 400 0 |
| 6 | යතුරු පැදියක් සඳහා | නොමිලේ | නොමිලේ | නොමිලේ |
| 7 | පාපැදියක් සඳහා | නොමිලේ | නොමිලේ | නොමිලේ |

01-60/22

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### විනෝද බදු ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත අනුව බදු පැනවීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1946 විනෝද බදු ආඥාපනතේ අංක 12 වන ජේදයේ 02(1) වගන්තිය ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන එකී පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමෙන් 15% ක බද්දක් පනවන බවත් ආගමික ස්ථානයක සිදු කරන පුණ්‍ය කටයුත්තක් හෝ විදුහලක මෙන්ම පුස්තකාලයක හෝ සංවර්ධන කටයුතු වෙනුවෙන් පෙන්නුම් කරන දර්ශන පිළිගත හැකි සාක්ෂි මත රැගුම් පාලනයේ අනුමැතිය පරිදි විනෝද බද්දෙන් නිදහස් කරන බවත්,

(176 අධිකාරිය වන) ප්‍රසිද්ධ රඟදැක්වීම ආඥාපනතේ 03 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු පහත දැක්වෙන අයුරින් 2022 වසර සඳහා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01. තාවකාලික චිත්‍රපට දර්ශන මැජික් දර්ශන, සර්කස් දර්ශන, නාට්‍ය දර්ශන සඳහා එක් දිනකට රුපියල් 1,000 බැගින්ද ඊට වැඩිවන සෑම දිනකටම රුපියල් 500 බැගින්ද,

02. සංගීත සංදර්ශනයකට එක් දිනකට 2,000 බැගින්ද වේ.

01-60/23

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

අනුකූලතා සහතිකය ලබාගැනීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලැගුම් නිවාස හා නවාතැන්පළක කාර්ය පවත්වන කිසියම් තැනැත්තෙකු විසින් එම පරිශ්‍රය ආරම්භ කර දින 30ක් ඇතුළත අදාළ ගාස්තුව ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු බවත් එසේ නොවන අවස්ථාවේ දී සංශෝධනය කරන ලද 2021.07.08 වන දින අංක 2235/54 දරන නිවාස හා නගර සංවර්ධන ආඥපනතට අනුව දිනකට රුපියල් 100.00 දඩමුදලක් අය කරන බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/24

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

මස්, මාළු සහ කරවල විකිණීම සඳහා ගාස්තු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (ix) (ඒ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1989 ජනවාරි මස 20 වැනි දින අංක 542/17 *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති (ආ) වැනි කොටස පළාත් පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ අංක 19 හා 20 ව්‍යවස්ථාවට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු හා කරවල, ගවමස්, එළුමස්, කුකුල් මස් යන මස් වර්ග විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවා විශේෂ බලපත්‍රයක් ලබාගත යුතු බවත්, ඒ අනුව වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීමට ගෝ ඝාතක ආඥාපනත ප්‍රකාරව 2022 වර්ෂයට 2022.01.01 වන දින සිට පහත උපලේඛනයට අනුව ගාස්තු අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *විකුණන මස්වල ස්වභාවය* | *අය කරන ගාස්තුව වාර්ෂික රු. ශත* |
|---|---|---|
| 1 | ගවමස්, එළුමස්, කුකුළුමස් යන මස්වර්ග සමග මාළු විකිණීම | 10,000 0 |
| 2 | ගවමස්, එළුමස්, කුකුළුමස් යන මස් වර්ග විකිණීම | 6,000 0 |
| 3 | ගවමස් හා එළුමස් යන මස් වර්ග විකිණීම | 4,000 0 |

| *උපලේඛනය* | | |
|---|---|---|
| *අනු අංකය* | *විකුණන මස්වල ස්වභාවය* | *අය කරන ගාස්තුව වාර්ෂික රු. ශත* |
| 4 | ගවමස් පමණක් විකිණීම | 2,000 0 |
| 5 | කුකුළුමස් පමණක් විකිණීම | 2,000 0 |
| 6 | මාළු හා කරවල පමණක් විකිණීම | 3,000 0 |
| 7 | මාළු පමණක් විකිණීම | 1,500 0 |
| 8 | කරවල පමණක් විකිණීම | 1,500 0 |

01-60/25

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

වීථි රේඛා සහතික සහ නොපරවා ගැනීමේ සහතික සඳහා ගාස්තු අයකිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 49 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දී ඇති බලතල ප්‍රකාරව, කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සඳහා ලබාදෙන වීථිරේඛා සහතික සහ නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු පහතාකාරයෙන් 2022 වර්ෂයට අය කරන බවත්,

තවද වීථිරේඛා සහතික සහ නොපවරවා ගැනීමේ සහතිකය සඳහා රු. 500.00 ක් සහ පරීක්ෂා කිරීමේ ගාස්තුව 200.00 අවමයකට යටත්ව, ඔප්පුවේ සඳහන් මුළු වටිනාකම රු. 100,000.00 දක්වා වන විට 01% ක් රු. 100,000.00 ඉක්මවන විට ඔප්පුවේ සඳහන් මුළු වටිනාකමින් 0.5% බැගින් වූ ගාස්තුවක් අය කරනු ලබන අතර, මේ වූ මුදල රුපියල් 5,000.00ට අඩු වන්නේ නම් මාස හයකටද, රුපියල් 5,000.00 - 10,000.00 අතර නම් වසරකට ද 10,000.00 - 20,000.00 ට වැඩි වන්නේනම් වසර තුනකටද, 20,000.00 - 50,000.00 ට වැඩි වන්නේනම් වසර හතරකටද, රු. 50,000.00 ට වැඩි වන්නේ නම් වසර පහකටද වලංගු වන බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/26

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

ජල බලපත්‍ර ගාස්තු අයකිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126, 16 වගන්ති මගින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වැනි වගන්තිය යටතේ 1988.03.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ පළකර ඇති පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 34 වැනි ඛණ්ඩයේ ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා ප්‍රදේශය මගින් සපයන ජල යෝජනා ක්‍රමයේ පාරිභෝගික ජලගාස්තු 2022 වර්ෂයට පහත උපලේඛනය අනුව අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| උපලේඛනය | | | |
|---|---|---|---|
| අනු අංකය | ජල ගාස්තුව | අය කරන ගාස්තුව නිවාස | අයකරන ගාස්තුව වානිජ |
| | | රුපියල් | රුපියල් |
| 1 | ඒකක 1-15 ලීටර් දක්වා | 10.00 | 15.00 |
| 2 | ඒකක 15-20 ලීටර් දක්වා | 15.00 | 30.00 |
| 3 | ඒකක 20-25 ලීටර් දක්වා | 20.00 | 50.00 |
| 4 | ඒකක 25-50 ලීටර් දක්වා | 30.00 | 70.00 |
| 5 | ඒකක 25 ට වැඩි සෑම ලීටරයකටම | 1.00 | 1.50 |

01-60/27

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

වැට් බදු අය කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විනෝද සහ ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ගාස්තු ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු ව්‍යාපාර බදු යන ආදායම් අය කිරීමේ දී ආදායම් දෙපාර්මේන්තුව විසින් නියම කරන ලද වැට් බද්දක් 2022 වර්ෂයට අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/28

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

ජාතික පාරිසරික ආරක්ෂණ බලපත්‍රය - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා වර්ෂ 1988 අංක 56 දරන හා 2000 වසරේ අංක 53 දරන සංශෝධිත පනත්වලින් හා වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබා දී ඇති බලතල අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ක්‍රියාවන් සඳහා එකී පනතේ සහ එහි සංශෝධන යටතේ සහ ඒ යටතේ පනවන රෙගුලාසි වලට අනුකූලව මෙම ක්‍රියාකාරකම් කරන්නන් සඳහා 2022 වසර සඳහා වසර 03කට අදාළ බලපත්‍රයක් ලබාගැනීමට පහත සඳහන් 01 වැනි උපලේඛනයට අනුව ගාස්තුවක් ආයෝජනය කළ මුදල මත පරීක්ෂණ ගාස්තුවක් ද ප්‍රාදේශීය සභාවට ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු බව මෙයින් නිවේදනය කරමි.

| උපලේඛනය III | |
|---|---|
| පරීක්ෂණ ගාස්තු අය කිරීම | |
| අනු. අංකය | මූලික ආයෝජනය රුපියල් |
| 1 | 100,000.00ට අඩු |
| 2 | 100,001.00 සිට වැඩි 250,000.00 |
| 3 | 250,001.00 සිට වැඩි 500,000.00 |
| 4 | 500,001.00 සිට වැඩි 1,000,000.00 |
| 5 | 1,000,000.00ට වැඩි |

2008.02.01 වැනි දින අංක 1534/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* I පළමුවන කොටසේ පළ කර ඇති ආකාරයට කුච්චවේලි ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ සිදු කරන ඉහත සඳහන් ව්‍යාපාර සඳහා පෙරසැරි ගාස්තු අයදුම්පත් ගාස්තු ආදිය 2022 වර්ෂයට අය කරන බව 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බවත්, තවද ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව අය කරන බලපත්‍ර ගාස්තු මේ සඳහා කිසිදු අයුරකින් බල නොපාන බව වැඩි දුරටත් මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/29

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනතට අනුව මස්කඩ බදු දීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ xi (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව හා ගෝ ඝාතක ආඥාපනතේ අංක (272 අධිකාරය) 17 (i) වගන්තිය ප්‍රකාරව හා 1989.01.20 වන දින අංක 520/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පළ කර ඇති පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවට අංක 32 හා 20 අනුව මාහට පැවරී ඇති බලතල අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ගවමස් හා එළුමස්, කුකුළුමස් කඩවල් යන මස් කඩවල් 2022 වසර සඳහා අදළ නිබන්ධන හා කොන්දේසි මත අදළ ප්‍රදේශයේ පිහිටා ඇති මස්කඩ ටෙන්ඩර් කැඳවන බවත් එසේ සභාවෙන් ටෙන්ඩර් ලබා ගත් සෑම ටෙන්ඩර්කරුවකුටම ගෝ ඝාතක ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබා දෙන බවත් තවද ගෝ ඝාතක ආඥාපනතේ අංක (272 අධිකාරය) 17 (i) වගන්තිය ප්‍රකාරව මාහට පැවරී ඇති බලතල මත හා පහත උපලේඛනයේ සඳහන් පරිදි හා රජය විසින් අනුමත දිනයන්හි මෙන්ම මා විසින් විටින් විට දනුම් දෙනු ලබන දිනයන්හි මස් ඝාතනය මෙන්ම මස් වර්ග විකිණීම පිණිස එල්ලා තැබීම හා මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන් ම තහනම් කළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1. තෛපොන්ගල් දිනය
2. මාට්ටු පොන්ගල් (තෛපොන්ගල් දිනයට පසු දින)
3. ශ්‍රී ලංකා නිදහස් දිනය
4. මහා සිවරාත්‍රී දිනය
5. මහා සිකුරාද දිනය
6. වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දින
7. ලෝක සත්ත්ව දිනය
8. දීපවාලි අලුත් අවුරුද්ද
9. මාසික පෝය දිනවල
10. සිංහල හින්දු අලුත් අවුරුද්දට පසු එන දින දෙක
11. රජය විසින් ප්‍රකාශයට පත් කරන වෙනත් දිනයන්

01-60/30

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

පෞද්ගලික ගවඝාතකාගාර සහ මස් වෙළෙඳසැල් පැවැත්වීම සහ මස් ප්‍රවාහනය සඳහා වූ විශේෂ බලපත්‍ර ගාස්තු අය කිරීම පිළිබඳ නිවේදනය - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 වගන්තියේ 1 හා 2 වගන්ති ප්‍රකාරව හා එකී පනතේ 126 වගන්තියේ xi (එ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව හා ගෝඝාතක ආඥාපනතේ අංක (272 අධිකාරය) 17 (i) වගන්තිය ප්‍රකාරව මා හට පැවරී ඇති බලතල අනුව හා 1989.01.20 වන දින අංක 520/07 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පළ කර ඇති පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවට අංක 32 හා 20 අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාවේ ගෝ ඝාතකාගාරයට අමතරව පෞද්ගලිකමය වශයෙන් ගවමස් සහ එළුමස් වෙළෙඳසැල් පැවැත්වීම හෝ චේවා මේ වූ මස් සෞඛ්‍යාරක්ෂිතව පැකට් කර හෝ වෙනත් ක්‍රමයකට අනුව ව්‍යාපාර කිරීමේ අරමුණින් කුඩා මෙන්ම මහා පරිමාණමය වශයෙන් පවත්වන ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදෙන බවත්, තවද මේ වූ මස් ප්‍රවාහනය කිරීමේ දී පහත උපලේඛනයට අනුව ඒ වූ මස් කඩ සඳහා විශේෂ ගාස්තු පනවා අය කරන බවත් ඒ සඳහා විශේෂ වූ බලපත්‍රයක් ලබා ගත යුතු බවත් 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බවත් මෙයින් නිවේදනය කරමි.

01 කිසියම් කෙනෙකු පාලන බල ප්‍රදේශය තුළ පෞද්ගලික ගව හා එළු ඝාතනාගාරයක් පවත්වනු ලබන්නේ නම් ඒ සඳහා වෙළෙඳ බලපත්‍ර ලබා ගත යුතු බවත් එසේම මේ හා සම්බන්ධ අනෙකුත් ආයතනවල නිර්දේශ ලබා මෙය පැවැත්විය යුතු බවත්, එසේම මෙම ස්ථානයේ ඝාතනය කරනු ලබන සෑම ගවයෙකු සඳහාම රු. 50.00 ගාස්තුවක් ද සෑම එළුවෙකු සඳහාම රු. 25.00 ගාස්තුවක් ගෙවිය යුතු බවත්,

| | | |
|---|---|---|
| I | ගවයින් සඳහා ගෝ ඝාතකාගාර බලපත්‍ර ගාස්තු | රු. 2000.00 |
| II | එළුවන් ඝාතනය කිරීම සඳහා ගෝ ඝාතකාගාර බලපත්‍ර ගාස්තු | රු. 1000.00 |

02 ගවමස් හා එළුමස් කඩ සඳහා වාර්ෂික ගාස්තුව වශයෙන් අදාළ ප්‍රදේශවලට සභාව විසින් ටෙන්ඩර් ලබා දී ඇති මුදලට වඩා 10%ක අතිරේක මුදලක් සභාවට ගෙවීමට එකඟ වන විටදී අදාළ පාර්ශවයට අනුමැතිය ලබා දීමට සභාව විසින් තීරණය කර ඇති බවත්, තවද අදාළ මාසිකව ගාස්තුව 10 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත්, එදිනට පසුව ගෙවන විටදී 10%ක දඩ මුදලක්ද අයකරන බවත් තවද අදාළ වසර සඳහා මස් කඩ බද්දට ලබා ගන්නා අවස්ථාවේ දී මාස 1/3 පංගුවක තැන්පත් මුදලක් සභාවට ගෙවිය යුතු බවත්,

03 ගවමස් හා එළුමස් පාලන බලප්‍රදේශය තුළ ප්‍රවාහනය කිරීමේ දී ප්‍රවාහන බලපත්‍ර ගාස්තු වශයෙන් විශේෂ ගාස්තුවක් අදාළ කාල සීමාවට අය කරන බවත් තාවකාලික බලපත්‍ර උපරිම මාසයක කාලයකට ලබා දෙන බවත් තවද මෙම අනුමැතිය සඳහා දිනකට රුපියල් 100.00 බැගින් අය කරන බවත් එසේම සභාවේ ගෝ ඝාතකාගාර සඳහා වූ සියලුම කොන්දේසි මේ සඳහාද වලංගු වන බවත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/31

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ගාල් නොකරන ලද සතුන් තහනම් කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 දරන (1) (3) (4) යන වගන්තියේ පනතට අනුව හා එකී පනතේ 126 වගන්තියේ xi (ඌ) වගන්තිය කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ප්‍රධාන මාර්ගවල හෝ අභ්‍යන්තර මාර්ගවල හෝ පොදු ස්ථානවල නොබැද අයාලේ ගැවසෙන එළුවන්, ගවයින්ව ආදී සතුන්ව ප්‍රාදේශීය සභාවේ සේවකයින් විසින් අල්ලන බවත් එම සතුන් නඩත්තු ගාස්තුවක් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2022 වසරට ගාස්තු පනවා අය කරන බවත්, ගවයින් අල්ලන දින සිට දින 14ක් ඇතුළත ගවහිමියන් විසින් සතුන් නිදහස් කර නොගත් අවස්ථාවේ දී එම සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඒ වූ මුදල් සභාවේ ගිණුමේ තැන්පත් කරන බවත් තවද ගව හිමියාට විරුද්ධව නීතිමය පියවර ගන්නා බවත් 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | ගාල් නොකරන සතෙකු ඇල්ලීම සඳහා ගාස්තු | 1,500 0 |
| 2. | අයාලේ ගිය සතාව ආරක්ෂා කිරීමේ ගාස්තු (එක් සතෙකුට) | 750 0 |
| 3. | අයාලේ ගිය සතාව නඩත්තු ගාස්තු (දිනකට) | 500 0 |
| 4. | පැය 24ක් තුළදී නැවත අයාලේ ගිය සතාව භාර නොගන්නා අවස්ථාවේ දී (අතිරේක සෑම දිනක් සඳහාම) | 500 0 |

01-60/32

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ xi (ඊ) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති කරනු ලබන සෑම සුනඛයෙකු සඳහාම රු. 05.00ක ලියාපදිංචි ගාස්තුවක්

පනවා අය කරන බව මෙයින් නිවවේදනය කරමි. මෙම ගාස්තුව 2022 වර්ෂය සඳහා අය කරන ගාස්තුව 2022 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/33

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

කළුගල්, වැලි, බොරළු පටවන වාහන සඳහා ප්‍රවාහන ගාස්තු - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත ද්‍රව්‍යය පාලන බල ප්‍රදේශය තුළින් ප්‍රවාහනය කරන විටදී ඒ සඳහා අදාළ ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවත් එම ගාස්තු පහත උපලේඛනයට අනුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් තවද කියුබ් 100ක් අවසන් වූ පසු නැවතත් බලපත්‍රය අදාළ ගාස්තු ගෙවා අළුත් කර ගත යුතු බවත් 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | බොරළු කියුබ් එකක් සඳහා | 100 0 |
| 2. | වැලි කියුබ් එකක් සඳහා | 100 0 |
| 3. | කළුගල් කියුබ් එකක් සඳහා | 100 0 |
| 4. | ගඩොල් සහ උළු සහ සීට් ලෝඩ් එකක් සඳහා | 100 0 |

01-60/34

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

ජංගම වෙළෙඳාමේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා ගාස්තු අය කිරීම - 2022

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පැවරී ඇති බලතල වලට අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පිටු අංක iv (ආ) හි ප්‍රාදේශීය පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළකළ අතුරු ව්‍යවස්ථාවේ අංක 28 දරන පනත ප්‍රකාරව කුච්චවේලි ප්‍රදේශයේ පාලන බල ප්‍රදේශය තුළ ස්ථිර ව්‍යාපාර ස්ථානයක් නොමැතිව ජංගම වෙළෙඳාමේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා වර්ෂ 2021.09.27 වන දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක

15 යටතේ පහත උපලේඛනයට අනුව ගාස්තු පනවා අය කරන බව අයකළ යුතු බව සභාව විසින් තීරණය කළ බවත් ඒ සඳහා වූ ගාස්තු වර්ෂ 2022.01.01 දින සිට අය කරන බවත් මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *ව්‍යාපාරයේ ස්වභාවය* | | *බදු රු. ශත* |
|---|---|---|---|
| 1. | ලොරි මගින් ව්‍යාපාරයේ යෙදෙන ව්‍යාපාරිකයන් සඳහා (දිනකට) | | |
| | බිත්තර, පොල්, අයිස් ක්‍රීම් වැනි | | 100 0 |
| 2. | අත්කරත්ත තල්ලු කරන කරත්ත ආදිය මගින් සෞඛ්‍යයට හිතකර | | |
| | ආහාරපාන විකිණීම සඳහා (වසරකට) | | 1,000 0 |
| 3. | රථවාහන මගින් කිරි වෙළෙඳාම සඳහා (වසරකට) | | 1,000 0 |
| 4. | සම්මන්ත්‍රණ ශාලා කුළියට දීම | දිනකට | 1,000 0 |
| 5. | වාණිජ පදනම මත ඇතුල් වන වාහන ගාස්තු | දිනකට | 50 0 |
| 6. | වෙරළාසන්නයේ ඇති තාවකාලික ව්‍යාපාර ස්ථාන සඳහා | දිනකට | 100 0 |
| 7. | කේබල් සම්බන්ධීකරණ ලබාදෙන එක් කුළුණකට | වසරකට | 5,000 0 |

01-60/35

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනු කොටස්වලට බෙදීමේ සැලසුම් අනුමත කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) සමග කියවිය යුතු 122 හා 126 යන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව කැබැලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීම වර්ග මීටර් 1 සිට 500 දක්වා රුපියල් 2,000.00 ක් සහ ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම හා වෙනත් ඉදි කිරීම සඳහා නගර සංවර්ධන ආඥාපනතට අනුව ගාස්තුවක් පනවා අය කිරීමට 2021.09.27 වන දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බවත් ඒ සඳහා වූ ගාස්තු වර්ෂ 2022.01.01 දින සිට අය කරන බවත් මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/36

## කුච්චවෙලි ප්‍රාදේශීය සභාව

### විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21 හා 78 හා 47 (අ) වගන්ති ප්‍රකාරව හා 1988.08.23 වන දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 1990.09.14 වැනි දින 628 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය මගින් කුච්චවෙලි ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවට (අංක 08) අනුව හා නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ (268 වැනි අධිකාරිය) විධිවිධානවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වසර සඳහා ද කුච්චවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන බවත් ඒ සඳහා වූ ගාස්තු නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 2021 ජූලි මස 08 වන දින බ්‍රහස්පතින්ද නිකුත් කරන ලද අංක 2235/54 දරන නව සංශෝධන චක්‍රලේඛයට අනුව අය කරන බවත් තවද අදාළ ව්‍යාපෘති සඳහා වූ අනුමැතිය නීත්‍යානුකූලව ලබා ගත යුතු බවත් එසේ නොකරන අවස්ථාවකදී අදාළ නීතිමය ක්‍රියාමාර්ග දියත් කරන බවත් 2021 09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවෙලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවෙලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/37

---

## කුච්චවෙලි ප්‍රාදේශීය සභාව

### සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා වාහන කුළියට දීම සඳහා ගාස්තු අය කිරීම - 2022

වර්ෂ 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන පනතට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සභාවට අයත් වාහන හා එයට සවි කරන අනෙකුත් කොටස් කුළියට දීම සඳහා වර්ෂ 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් පහත උපලේඛනයට අනුව ගාස්තු ගෙවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවෙලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවෙලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය X

| | | | | | | *අමතර සෑම පැයක් සඳහාම තැන්පතුව රු. ශත* |
|---|---|---|---|---|---|---|
| | | | | *රු. ශත* | *රු. ශත* | |
| 1. | ට්‍රැක්ටරය පෙට්ටියත් සමග | පැය 08ක් සඳහා | - | 4,500 0 | 400 0 | 4,500 0 |
| 2. | Bibrator | පැය 08ක් සඳහා | - | 2,800 0 | 300 0 | 2,800 0 |
| 3. | මික්සර් මැෂින් | පැය 08ක් සඳහා | - | 3,400 0 | 300 0 | 3,400 0 |
| 4. | ජල බවුසර් ට්‍රැක්ටරය පෙට්ටියත් සමග | පැය 08ක් සඳහා | - | 4,400 0 | 350 0 | 4,400 0 |
| 5. | රෝලර් | පැය 06ක් සඳහා (ටොන් 8-10) | - | 7,750 0 | 650 0 | 7,750 0 |
| 6. | ටිපර් | පැය 08ක් සඳහා | - | 7,750 0 | 550 0 | 7,750 0 |
| 7. | ජල බවුසර් | පැය 08ක් සඳහා | - | 1,750 0 | 150 0 | 1,750 0 |

| | | සභා බල ප්‍රදේශය තුළ රු. ශත | සභා බල ප්‍රදේශය පිටත රු. ශත |
|---|---|---|---|
| 8. | ගලිබවුසර් ලෝඩ් එකක් සඳහා - | | |
| I. | පාසැල් හා ආගමික ස්ථාන සඳහා (ලෝඩ් 01) | 3,000 0 | 3,500 0 |
| II. | නිවාස සඳහා (ලෝඩ් 01) | 4,200 0 | 4,600 0 |
| III. | රාජ්‍ය දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සහ බැංකු | 7,500 0 | 8,500 0 |
| Iv. | පෞද්ගලික ආයතන හා හෝටල් සඳහා | 10,000 0 | 12,000 0 |
| 9. | බැකෝ යන්ත්‍රය (JCB) | 3,600 0 | 4,000 0 |

**උපලේඛනය**

කසළ ඉවත් කිරීමේ ගාස්තු

| අංකය | | ප්‍රාදේශීය සභාවේ වාහන රු. ශත | පෞද්ගලික වාහන රු. ශත |
|---|---|---|---|
| 1. | කිලෝග්‍රෑම් 25 ක් ඇතුළත කසළ සඳහා එක් වතාවකට | 600 0 | 300 0 |
| 2. | කිලෝග්‍රෑම් 25 ත් 50ත් අතර කසළ සඳහා එක් වතාවකට | 1,200 0 | 600 0 |
| 3. | කිලෝග්‍රෑම් 50 ට වඩා වැඩි අතර කසළ සඳහා එක් වතාවකට | 1,600 0 | 800 0 |

01-60/38

---

**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

සභාවට අයත් සුසානභූමි ප්‍රකාශයට පත් කිරීම හා එහි ස්මාරක ඉදි කිරීම සම්බන්ධව - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 127 වගන්ති ප්‍රකාරව (සුසානභූමි සහ මිනීපිටි ආඥාපනතේ 03 වන වගන්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා) ප්‍රාදේශීය සභාවට පවරා ඇති බලතල ප්‍රකාරව පහත නම් සඳහන් සුසානභූමි සහ මිනීපිටිවල පවතින ඉඩ ප්‍රමාණය අවමවීම හේතුකොට ගෙන මහජන සුභසාධනය උදෙසා කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සුසානභූමි සහ මිනීපිටිවල සිහිවටන ස්මාරක ඉදි කිරීම සඳහා සභාවේ අනුමැති ලබා නොදෙන බව 2021.09.27 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුසාන භූමි විස්තර :

| අනු. අංකය | නම |
|---|---|
| 1 | පෙරියකුලම් |
| 2 | ඉක්බාල් නගර් |
| 3 | ඉක්බාල් නගර් |
| 4 | අඩම්බොඩෙ |
| 5 | |
| 6 | ගෝපාලපුරම් |

| *අනු. අංකය* | *නම* |
|---|---|
| 7 | එරක්කන්ඩි |
| 8 | වාලෛලඋත්තු |
| 9 | කුඹුරුපිටිය |
| 10 | සලපයාරු |
| 11 | වීරන්චෝලෛ |
| 12 | වඩිලිකුලම් |
| 13 | කාසිම් නගර් |
| 14 | ජයා නගර් |
| 15 | පුඩවයිකට්ටු |
| 16 | සෙන්දූර් |
| 17 | මදුරන්කුඩා |
| 18 | කල්ලරාව |
| 19 | පුල්මුඩේ 1 |
| 20 | පුල්මුඩේ 4 |
| 21 | පුල්මුඩේ 4 |
| 22 | තෙන්නරමරවාඩි |

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/39

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ වෙළෙඳපොළවල් - 2022

1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරන පනතට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පැවරී ඇති බලතල වලට අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පිටු අංක iv (ආ) හි ප්‍රාදේශීය පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළ කළ අතුරු ව්‍යවස්ථාවේ අංක 33 දරන පනත ප්‍රකාරව කුච්චවේලි ප්‍රදේශයේ පාලන බල ප්‍රදේශය තුළ වෙරළාසන්නයේ පිහිටා ඇති සභාවට අයත් කඩ කාමර නිබන්ධන සහිතව ව්‍යාපාරිකයින්ට කුළියට හෝ බද්දට දෙන බවත් ඒ සඳහා වූ නියමිත ගාස්තු අය කරන බවත් තවද මේ සඳහා අනුමැතිය ලබා නොගෙන ව්‍යාපාර දියත් කළහොත් අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් මෙය 2022.01.01 දින සිට අය කරන බවද මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/40

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### ප්‍රවාහනය කරන වාහනවල ධාවන වේගය හා බර සීමා කිරීම හා මාර්ගවලට අදාළ නම් යෙදීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126 ඡේදයේ vii(ඇ) වගන්තිය ප්‍රකාරව හා 1988.08.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් පළ කරන ලද අංක 520/7 දරන අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන අංක 03 හි දක්වා ඇති පරිදි කුච්චවේලි සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මාර්ගවල ධාවනය වන වාහනවල බර හා වේගය සීමා කරන බවත් තවද ප්‍රාදේශීය සභා පනතේ අංක 24-27 දක්වා ඇති පරිදි සභාවට අයත් මාර්ග *ගැසට්* පත්‍රයේ පළ කර අදාළ ක්‍රියාමාර්ග ගන්නා බවත් මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/41

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### වැසිකිළි සහ ළිං තැනීම සම්බන්ධව - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 89 සිට 92 දක්වා වගන්ති ප්‍රකාරව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන අංක 12 දරන අතුරු ව්‍යවස්ථාවට අංක 12 අතුරු ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය සභාවට පවරා ඇති බලතල ප්‍රකාරව 2022 වසර සඳහාද කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නව වැසිකිළි ඉදි කිරීම අලුත්වැඩියා කිරීම හා වෙනස් කිරීම සිදු කරන විටදී සභාවේ අනුමැති ලබාගත යුතු බවත්

තවද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126 ඡේදයේ xix වගන්තිය ප්‍රකාරව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන අංක 35 සහ 37 දරන අතුරු ව්‍යවස්ථා අනුව ප්‍රාදේශීය සභාවට පවරා ඇති බලතල ප්‍රකාරව 2022 වසර සඳහාද කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාවේ අනුමැතිය ලබා නව ළිං ඉදිකිරීම අලුත්වැඩියා කිරීම හා වෙනස් කිරීම සිදු කළ යුතු බවත් තවද සියලුම ඉදි කිරීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නීත්‍යානුකූලව අනුමැතිය ලබා ගත යුතු බවත් එසේ නොකරන අවස්ථාවකදී අදාළ නීතිමය ක්‍රියාමාර්ග දියත් කරන බවත් එසේම ප්‍රාදේශීය සභා පනතේ අංක 126 ඡේදයේ xiii වගන්ති ප්‍රකාරව (අ සිට ඕ වගන්ති දක්වා) ක්‍රියාකරන බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීම් තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/42

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

### විශේෂ කසළ ඉවත් කිරීමේ සේවය - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුච්චවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ස්ථානවල විශේෂ වූ කසළ ඉවත් කිරීමේ වැඩපිළිවෙල දියත් කරන බවත් ඒ සඳහා ගාස්තු ලෝඩ් එකකට රුපියල් තුන් දහසක් අය කරන බවත් 2021.09.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 15 යටතේ සභාව විසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඒ. මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 27 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-60/43

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

## 2022 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 01.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 01.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.